# තෙරුවන් ගුණ වන්දනාව

ශ්‍රී ලාංකික බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
Sri Lankan Buddhist Cultural Centre - Hong Kong
4/F, 165, Sai Yueng Choi St. North, Prince Edward, Kowloon, Hong Kong
Email: slbcchk@gmail.com Phone: (00852) 53608945
FB: https://www.facebook.com/slbcchk/










# තෙරුවන් ගුණ වන්දනාව

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්දස්ස!**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්දස්ස!!**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්දස්ස!!!**
ඒ භාග්‍යවත් වූ, අරහත් වූ, සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා! දෙවනුවද, තුන්වනුවද, මාගේ නමස්කාරය වේවා!

## බුද්ධරත්නය වැඳීම

**ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝපුරිසදම්මසාරථී සත්ථාදේවමනුස්සානං බුද්ධෝ භගවාති.**
ඒ භාග්‍යවතුන් වහන්සේ
අරහං - පූජා ලැබීමට සුදුසු වූ සේක. සම්මා සම්බුද්ධ - මනා කොට චතුරාර්යසත්‍ය ධර්මය තමන්වහන්සේම අවබෝධ කරගත් සේක. විජ්ජාචරණසම්පන්න - අෂ්ඨවිද්‍යාවන්ගෙන් හා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්ත වූ සේක. සුගත - මනා වූ ගමන් ඇති සේක. ලෝකවිදූ - තුන්ලොව තතු මනාව දත් සේක. අනුත්තර පුරිසදම්ම සාරථී - කිසිවකුට සමාන නොවන සේ පුද්ගලයන් දමනය කල සේක. සත්තා දේවමනුස්සානං - දෙව් මිනිසුන්ට සාස්තෘ වූ සේක. බුද්ධො - චතුරාර්යසත්‍ය ධර්මය අවබෝධ කරගත් සේක. භගවා - පුණ්‍යවන්ත බැවින් යුත්ත වූ සේක.

**බුද්ධං ජීවිත පරියන්තං - සරණං ගච්ඡාමි**
බුද්ධ රත්නය මම දිවිහිමියෙන් සරණ යමි

**යේච බුද්ධා අතීතා ච - යේච බුද්ධා අනාගතා**
**පච්චුප්පන්නා ච යේ බුද්ධා - අහං වන්දාමි සබ්බදා**
අතීතයේ පහල වූ බුදු රජාණන් වහන්සේලා ට ද, අනාගතයේ පහල වන්නාවූ බුදු රජාණන් වහන්සේලා ට ද, වර්ථමාන බුද්ධෝත්පාද කාලයේ හි පහල වූ බුදු රජාණන් වහන්සේ ට ද මම සැම කල්හි ම නමස්කාර කරමි, මාගේ නමස්කාරය වේවා.

**නත්ථි මේ සරණං අඤ්ඤං - බුද්ධෝ මේ සරණං වරං**
**ඒතෙන සච්ච වජ්ජේන - හෝතු මේ ජය මංගලං**

සම්මා සම්බුදු රජාණන් වහන්සේ හැර මට අන් සරණක් නැත්තේ ය. බුද්ධ රත්නය මගේ උත්තම රත්නය වන්නේ ය. මේ සත්‍යානුභාවයෙන් මා හට ජය මංගල්‍යයක් ම වේවා.

**උත්තමංගේන වන්දේහං - පාදපංසු වරුත්තමං**
**බුද්ධේ යෝ ඛලිතෝ දෝසෝ - බුද්ධෝ ඛමතු තං මමං**

භාග්‍යවතුන් වහන්සේ ගේ සිරිපා පහස ලද දූවිල්ලද දොහොත් මුදුන් දී මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා! බුද්ධ රත්නය කෙරෙහි මගෙන් යම් වරදක් සිදු වුනා නම් භාග්‍යවතුන් වහන්සේ මට අනුකම්පා කර ක්ෂමා වන සේක්වා.

## <u>ධර්මරත්නය වැදිම</u>

**ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ ඒහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤුහීති.**

භාග්‍යවතුන් වහන්සේ විසින් දේසිත සද්ධර්මය,
ස්වාක්ඛාතෝ - මුල, මැද, අග යහපත් වන පරිදි, මනා කොට දේශනා කරන ලද බැවින් ස්වාක්කාත නම් වන සේක.
සන්දිට්ඨිකෝ - තමා විසින්ම ප්‍රත්‍යක්ෂ කොට, තම තමා විසින්ම දැකිය හැකි බැවින් සන්දිට්ටික නම් වන සේක.
අකාලිකෝ - ධර්මයට අනුව හැසිරෙන්නන්ට එවෙලෙහි ම ඵල ලැබිය හැකි බැවින් අකාලික නම් වන සේක.
ඒහිපස්සිකෝ - මෙම ධර්මය පරීක්ෂා කරීමට, පිළිවෙත් පිරීමට ආරාධනා කිරීමට සුදුසු බැවින් ඒහිපස්සික නම් වන සේක.
ඕපනයිකෝ - අන් කිසිවකට වඩා තම සන්තානයේ පහල කර ගැනීමට සුදුසු බැවින් ඕපනයික නම් වන සේක.
පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤුහී - ධර්මයට අනුව හැසිරෙන සත්පුරුෂයාට ධර්මයෙහි යහපත් බව, තම සිතින් ම දැනගෙන විඳිය හැකි බැවින් මෙ නම් වන සේක.

**ධම්මං ජීවිත පරියන්තං - සරණං ගච්ඡාමි**

ධර්ම රත්නය මම දිවිහිමියෙන් සරණ යමි

**යේච ධම්මා අතීතා ච - යේච ධම්මා අනාගතා**
**පච්චුප්පන්නා ච යේ ධම්මා - අහං වන්දාමි සබ්බදා**

අතීත වූ ධර්ම රත්නයට ද, අනාගත වූ ධර්ම රත්නයට ද ට ද, වර්ථමාන වූ ධර්ම රත්නයට ද මම සැම කල්හි ම නමස්කාර කරමි, මාගේ නමස්කාරය වේවා.

**නත්ථි මේ සරණං අඤ්ඤං - ධම්මෝ මේ සරණං වරං.**
**ඒතෙන සච්ච වජ්ජේන - හෝතු මේ ජය මංගලං**

සම්මා සම්බුදු රජාණන් වහන්සේ දෙසූ උතුම් ධර්ම රත්නය හැර මට අන් සරණක් නැත්තේ ය. ධර්ම රත්නය මගේ උත්තම රත්නය වන්නේ ය. මේ සත්‍යානුභාවයෙන් මා හට ජය මංගල්‍යයක් ම වේවා.

**උත්තමංගේන වන්දේහං - ධම්මඤ්ච තිවිධං වරං**
**ධම්මේ යෝ ඛලිතෝ දොසෝ - ධම්මෝ ඛමතු තං මමං**

ලොව්තුරු, මගඵල, නිවන්, වූ ධර්ම රත්නයට දොහොත් මුදුන් දී මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා! ධම්ම රත්නය කෙරෙහි මගෙන් යම් වරදක් සිදු වුනා නම් මට අනුකම්පා කර ක්ෂමා වන සේක්වා.

<u>සංඝරත්නය වැඳීම</u>

**සුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ,**
**උජුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ,**
**ඤායපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ,**
**සාමීචිපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ,**
**යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා ඒස භගවතෝ සාවකසංඝෝ, ආහුණෙය්‍යෝ,පාහුණෙය්‍යෝ, දක්ඛිණෙය්‍යෝ, අංජලිකරණීයෝ ,අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සා'ති.**

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ වහන්සේ
සුපටිපන්නෝ - යහපත් වූ නිවන් මාර්ගයට මනාව පිළිපන්නේය.
උජුපටිපන්නෝ - ඍජු වූ පිළිවෙතින් යුක්තය, ඤායපටිපන්නෝ - සත්‍ය මාර්ගයට පිළිපන්නේය. සාමීචිපටිපන්නෝ - නිවැරදි මගට පිළිපන්නේය.
ආහුණෙය්‍යෝ - දුරිනිදු ගෙන හැර පිදීමට සුදුසුය, පාහුණෙය්‍යෝ - ආගන්තුක සත්කාර ලැබීමට සුදුසුය, දක්ඛිණෙය්‍යෝ - සිවුපසය ලැබීමට සුසුසුය, අංජලිකරණීයෝ - ඇදිලිබැද වැඳීමට සුදුසුය, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං - ලෝකයාට උතුම් පින් කෙතකි.

**සංඝං ජිවිත පරියන්තං - සරණං ගච්ඡාමි**

සංඝ රත්නය මම දිවිහිමියෙන් සරණ යමි.

**යේච සංඝා අතීතා ච - යේච සංඝා අනාගතා**
**පච්චුප්පන්නා ච යේ සංඝා - අහං වන්දාමි සබ්බදා**

අතීත වූ ආර්ය මහා සංඝ රත්නයට ද, අනාගත වූ ආර්ය මහා සංඝ රත්නයට ද ට ද, වර්ථමානයේ වැඩ සිටින ආර්ය මහා සංඝ රත්නයට ද මම සැම කල්හි ම නමස්කාර කරමි, මාගේ නමස්කාරය වේවා.

**නත්ථි මේ සරණං අඤ්ඤං - සංඝෝ මේ සරණං වරං.**
**ඒතේන සච්ච වජ්ජේන - හෝතු මේ ජය මංගලං**

සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගේ ආර්ය මහා සංඝ රත්නය හැර මට අන් සරණක් නැත්තේ ය. සංඝ රත්නය මගේ උත්තම රත්නය වන්නේ ය. මේ සත්‍යානුභාවයෙන් මා හට ජය මංගල්‍යයක් ම වේවා.

**උත්තමංගේන වන්දේහං - සංඝං ච තිවිධෝත්තමං**
**සංඝේ යෝ ඛලිතෝ දෝසෝ - සංඝෝ ඛමතු තං මමං**

සම්මුති, සේඛ අසේඛ යන උත්තම සංඝරත්නයට දොහොත් මුදුන් දී මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !. මහා සංඝරත්නය කෙරෙහි මගෙන් යම් වරදක් සිදු වුනා නම් උන්වහන්සේලා මට ක්ෂමා වන සේක්වා.

**සාදු... සාදු... සාදු...**

**නමාමි බුද්ධං ගුණසාගරන්තං**
**සත්තා සදා හොන්තු සුඛී අවේරා**
**කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ**
**ගච්ඡන්ති සබ්බේ මරණං අහංච**

අනන්ත ගුණ සාගරයක් බඳු වූ බුදුරජාණන් වහන්සේට මම නමස්කාර කරමි. සත්වයෝ සැමදා සැප ඇත්තෝ ද වෛර නැත්තෝ ද වෙත්වා. සකල ශරීරය පිළිකුල් සහගතය. දුර්ගන්ධය. මම ද සියලූ සත්වයෝ ද මරණයට පත්වෙති.

**නමාමි ධම්මං සුගතේන දේසිතං**
**සත්තා සදා හොන්තු සුඛී අවේරා**
**කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ**
**ගච්ඡන්ති සබ්බේ මරණං අහංච**

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්ම රත්නයට මම නමස්කාර කරමි. සත්වයෝ සැමදා සැප ඇත්තෝ ද වෛර නැත්තෝ ද වෙත්වා. සකල ශරීරය පිළිකුල් සහගතය, දුර්ගන්ධය. මම ද සියලූ සත්වයෝ ද මරණයට පත්වෙති.

**නමාමි සංඝං මුනිරාජසාවකං**
**සත්තා සදා හොන්තු සුඛී අවේරා**
**කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ**
**ගච්ඡන්ති සබ්බේ මරණං අහංච**

බුදුරජාණන් වහන්සේගේ සංඝ රත්නයට මම නමස්කාර කරමි. සත්වයෝ සැමදා සැප ඇත්තෝ ද වෛර නැත්තෝ ද වෙත්වා. සකල ශරීරය පිළිකුල් සහගතය. දුර්ගන්ධය. මම ද සියලු සත්වයෝ ද මරණයට පත්වෙති.

**නමෝ තේ පුරිසාජඤ්ඤ - නමෝ තේ පුරිසුත්තම**
**නමෝ තේ පුරිසාතුල්‍ය - නමෝ තේ පුරිසාසභ**
**නමෝ තේ බුද්ධ වීරත්තු - විප්පමුත්තොසි සබ්බධි**

**සාදු... සාදු... සාදු...**

**වණ්ණගන්ධ ගුණෝපේතං - ඒතං කුසුමසන්තතිං**
**පූජයාමි මුනින්දස්ස - සිරිපාද සරෝරුහේ**

වර්ණයෙන්, සුවඳින් හා ගුණයෙන් යුත්ත වූ මේ මල් සමූහය බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද පද්මයට පූජා කරමි.

**පූජේමි බුද්ධං කුසුමේනනේන - පුඤ්ඤේන මේතේන ලභාමි මොක්ඛං**
**පුප්ඵං මිලායාති යථා ඉදම්මේ - කායෝ තථා යාති විනාසභාවං**

මේ මල් බුදුරජාණන් වහන්සේට පූජා කරමි. මේ පින හේතුවෙන් මට නිවන ලැබේවා. මේ මල් යම් සේ පරවන්නේද මාගේ ශරීරයද එසේ විනාශ වන්නේය.

**ඝනසාරප්ප දිත්තේන - දීපේන තමධංසිනා**
**තිලෝකදීපං සම්බුද්ධං - පූජයාමි තමෝනුදං**

ඝන වූ තෙලින් සම්පාදනය කරගන්නා ලද මේ පහනින්, සංසාරයේ අඳුර දුරු කළ තුන්ලොවට පහනක් වූ සම්බුදුරජාණන් වහන්සේ පුදමි.

**සුගන්ධිකාය වදනං - අනන්ත ගුණගන්ධිනා**
**සුගන්ධිනාහං ගන්ධේන - පූජයාමි තථාගතං**

සුවඳවත් වූ ශරීරයෙන් හා වචනයෙන් යුත්ත වූ අනන්ත ගුණ සුවඳ ඇති බුදුරජාණන් වහන්සේට මම සුවඳ පූජා කරමි.

**නිවේදයාමි සම්බුද්ධං - වීතරාගං මහාමුනිං**
**නිමන්තයාමි සුගතං - ලෝකජෙට්ඨං නරාසභං**

සම්බුදුරජාණන් වහන්සේට දන්වා සිටිමි. ලෝකනායක වූ මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ වූ වීතරාගී වූ සුගත වූ මහා මුනීන්ද්‍රයන් වහන්සේට ආරාධනා කරමි.

**යාවතා භගවා ලෝකේ - තිට්ඨෙය්‍ය තව සාසනං**
**තාව ඨත්වාන ගන්හාතු - පූජං ලෝකානුකම්පයා**
භාග්‍යවතුන් වහන්ස, යම්තාක් කල් ලෝකයෙහි ඔබවහන්සේගේ සසුන පවතින්නේද ඒතාක් කල් ලෝකයාට අනුකම්පා පිණිස සිට පූජා පිළිගනීවා.

**සුගන්ධං සීතලං කප්පං - පසන්න මධුරං සුභං**
**පානීයමේතං භගවා - පතිගන්හාතුමුත්තමං**
සුවඳැති, සිසිල් වූ කැප වූ ප්‍රසන්න වූ මිහිරි වූ යහපත් වූ මේ උතුම්පැන් භාග්‍යවතුන් වහන්සේ පිළිගන්නා සේක්වා.

**<u>භෝජනපූජාව</u>**

**අධිවාසේතු නෝ භන්තේ - භෝජනං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**
ස්වාමීනි අප කෙරෙහි ඉවසාවා. අනකම්පාවෙන් මනාව පිළියෙළ කරන ලද උතුම් වූ භෝජනය පිළිගනීවා.

**<u>රස කැවිලි පූජාව</u>**

**අධිවාසේතු නෝ භන්තේ - කජ්ඣකං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**
ස්වාමීනි අප කෙරෙහි ඉවසාවා. අනුකම්පාවෙන් මනාව පිළියෙළ කරන ලද උතුම් වූ කැවිලි පිළිගනීවා.

**<u>ගිලන්පස පූජාව</u>**

**අධිවාසේතු නෝ භන්තේ - ගිලානපච්චයං ඉමං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**
ස්වාමීනි අප කෙරෙහි ඉවසාවා. අනකම්පාවෙන් මනාව පිළියෙළ කරන ලද උතුම් වූ ගිලන්පස පිළිගනීවා.

**<u>බෙහෙත් පූජාව</u>**

**අධිවාසේතු නෝ භන්තේ - බේසජ්ජං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**
ස්වාමීනි අප කෙරෙහි ඉවසාවා. අනකම්පාවෙන් මනාව පිළියෙළ කරන ල ද උතුම් වූ බෙහෙත් පිළිගනීවා.

<u>චතුමදුර පූජාව</u>

**අධිවාසේතු නෝ භන්තේ - චතුමදුරං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි අප කෙරෙහි ඉවසාවා. අනකම්පාවෙන් මනාව පිළියෙළ කරන ල ද උතුම් වූ චතුමදුර පිළිගනීවා.

<u>කිරි ආහාර පූජාව</u>

**අධිවාසේතු නෝ භන්තේ - පායාසං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි අප කෙරෙහි ඉවසාවා. අනුකම්පාවෙන් මනාව පිළියෙළ කරන ලද උතුම් වූ කිරි ආහාර පිළිගනීවා.

<u>දැහැත් පූජාව</u>

**නාගවල්ලි දලූපේතං - චුන්නපූග සමායුතං**
**තාම්බූලං පතිගණ්හාතු - සතං පූජේමිදං ජිනෝ**

බුලත්, සුණු, පුවක් වලින් යුත්ත වූ මෙම උතුම් දැහැත් පූජා කරමි. බුදුරජාණන් වහන්සේ පිළිගන්නා සේක්වා.

**අධිවාසේතු නෝ භන්තේ - සබ්බං සද්ධාය පූජිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි අප කෙරෙහි ඉවසාවා. අනුකම්පාවෙන් ශ්‍රද්ධාවෙන් පුදන ලද උතුම් වූ සියල්ල පිළිගනීවා.

**සාදු... සාදු... සාදු...**

**වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානේසු පතිට්ඨිතං**
**සාරීරිකධාතුමහාබෝධිං - බුද්ධරූපං සකලං සදා**

සියලූ තැන්හි මනාව පිහිටියා වූ ශාරීරික ධාතු සහිත සියලූ චෛත්‍යයන් ද සියලූ බෝධීන් වහන්සේලා ද සියලූ බුද්ධරූප ද සැමදා වදිමි.

**යස්ස මූලේ නිසින්නෝව - සබ්බාරිවිජයං අකා**
**පත්තෝ සබ්බඤ්ඤුතං සත්ථා - වන්දේතං බෝධිපාදපං**

ශාස්තෘන් වහන්සේ යම් වෘක්ෂයක් මුල හිඳිමින් සියලූ කෙලෙස් සතුරන් ජයග්‍රහණය කළේද බුද්ධත්වයට පැමිණියේද ඒ බෝධි වෘක්ෂය මම වදිමි.

**ඉමේ ඒතේ මහාබෝධි - ලෝකනාථේන පූජිතා**
**අහංපි තේ නමස්සාමි - බෝධිරාජා නමත්ථු තේ.**

ඒ මේ මහා බෝධීන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ විසින් පුදන ලදී. මමද ඒ බෝධීන් වහන්සේලා නමස්කාර කරමි. බෝධිරාජයාණන්වහන්ස ඔබවහන්සේට නමස්කාර වේවා.

**ගවුදුර ගෙවමින් වැඩි බුදු සමිඳුනි - දිවිමන් මුනිඳුන් දුටුව ලෙසින්**
**වැන්දා සමිඳුනි අද මම වැන්දා - සිරස තබා සිත් පුරා තුටින්**

**නීල උපුල් පෙති මලුපිට අතුරා - සතපා පියුමන් රෝස කුසුම්**
**වීතරාගි මුනිඳුන් නමදින්නෙමි - ඔබ පා යුග මා පුදා කුසුම්**

**සමිඳුන් අබියස රන් සිලු වේවා - දිලි දිලි සැලෙනා නේක පහන්**
**අම රස දේවා පිදෙනා දන් පැන් - මිහිරි ගිලන්පස නිවා ගිමන්**

**හමා හමා යන මුදු මද පවනේ - සම්බුදු සුසුවඳ දැනේ උතුම්**
**ඒ මුදු සුවඳට සුවඳ පුදා අපි - වඳිමු වඳිමු සිත් පුරා තුටින්**

**පින්බර බුදු රුව දුටුවා වාගේ - නැත මට සතුටක් වෙන මෙතරම්**
**පූජා වේවා මගෙ මුලු දිවියම - අභියස සම්බුදු පාද පියුම්**

**සාදු... සාදු... සාදු...**

## <u>මඞ්ගලසුත්තං - මංගල සූත්‍රය</u>

**ඒවං මේ සුතං – ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. අථ ඛෝ අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කේවලකප්පං ජේතවනං ඕභාසෙත්වා යේන භගවා තේනුපසංකමි; උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි. ඒකමන්තං ඨිතා ඛෝ සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි –**

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවන නම් වූ අනේපිඬු මහ සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එකල්හි එක්තරා දෙවියෙක් රෑ (පෙර යම්) ඉක්ම ගිය කල්හි විශිෂ්ට ශරීරශොභා ඇත්තේ සියලු ජේතවනය (ස්වකීය) ශරීරශොභාවයෙන් බබුලුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එ තැනට එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි ඒ දෙවි තෙම භාග්‍යවතුන්වහන්සේට ගාථායෙන් (මෙසේ) කීයේ ය:

1. **බහූ දේවා මනුස්සා ච - මංගලානි අචින්තයුං;**
**ආකංඛමානා සොත්ථානං - බ්‍රෑහි මංගලමුත්තමං**

බොහෝ දෙවියෝ ද මිනිස්සු ද (දෙලෝ වැඩ සලසන) මංගල කාරණයන් සිතූහ. වැඩ සලසන උතුම් මඟුල් (මඞ්ගල කාරණ) වදාළ මැනැවි.

2. **අසේවනා ච බාලානං - පණ්ඩිතානඤ්ච සේවනා;**
**පූජා ච පූජනීයානං - ඒතං මංගලමුත්තමං.**

බාලයන් ඇසුරු නොකිරීම ද මංගල කාරණයකි. පණ්ඩිතයන් ඇසුරු කිරීම ද මංගල කාරණයකි. පිදිය යුත්තන් පිදීම ද මංගල කාරණයකි. මේ (එක එකෙක්) උතුම් මංගල කාරණයන්ය.

3. **පතිරූපදේසවාසෝ ච - පුබ්බේ ච කතපුඤ්ඤතා;**
**අත්තසම්මාපණිධි ච - ඒතං මංගලමුත්තමං.**

සුදුසු පෙදෙසෙහි විසීම ද, පෙරකළ පින් ඇති බව ද, සිය අත්බව (ශීලාදී) මනා දහම්හි පිහිටුවීම ද යන මේ (එක එකෙක්) උතුම් මංගල කාරණයන්ය.

4. **බාහුසච්චඤ්ච සිප්පඤ්ච - විනයෝ ච සුසික්ඛිතෝ;**
**සුභාසිතා ච යා වාචා - ඒතං මංගලමුත්තමං.**

බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ද, (ගිහි පැවිදි) සිප්හි අත් හුරු බව ද, මොනොවට හික්මුනු තුන් දොර ඇති බව ද, මොනොවට කියන ලද වචනය ද (මුසාවා ආදියෙන් වැළකි වචනය ද) යන මේ (එක එකෙක්) උතුම් මංගල කාරණයන්ය.

5. **මාතාපිතු උපට්ඨානං - පුත්තදාරස්ස සංගහෝ;**
**අනාකුලා ච කම්මන්තා - ඒතං මංගලමුත්තමං.**

මවුට උවටැන් කිරීම ද, පියාට උවටැන් කිරීම ද, අඹුදරුවනට සංග්‍රහ කිරීම ද, (ගොවිතැන් ආදි) නිරවුල් කර්මාන්තය ද යන මේ (එක එකෙක්) උතුම් මංගල කාරණයන්ය.

6. **දානඤ්ච ධම්මචරියා ච - ඤාතකානඤ්ච සංගහෝ;**
**අනවජ්ජානි කම්මානි - ඒතං මංගලමුත්තමං.**

දානය ද, දස කුසල්දහම්හි හැසිරීම ද, නෑයන්ට සංග්‍රහ ද, පෙහෙවස් විසීම් ආදි නිවැරැදි කර්ම ද යන මේ (එක එකෙක්) උතුම් මංගල කාරණයන්ය.

7. **ආරතී විරතී පාපා - මජ්ජපානා ච සඤ්ඤමෝ;**
**අප්පමාදෝ ච ධම්මේසු - ඒතං මංගලමුත්තමං.**

මානසික අකුශලයෙන් වැළැක්ම ද, කායික වාචසික අකුශලයෙන් වැළැක්ම ද, මත්පැනෙන් වැළැක්ම ද, කුසලදහම් වැඩීමෙහි නොපමා බව ද යන මේ (එක එකෙක්) උතුම් මංගල කාරණයන්ය.

## 8. ගාරවෝ ච නිවාතෝ ච - සන්තුට්ඨී ච කතඤ්ඤුතා; කාලේන ධම්මසවනං - ඒතං මංගලමුත්තමං.

ගරු කටයුත්තන්ට ගරු කිරීම ද, මන් නැති බව ද (නිහතමාන බව) ද, ලද දැයින් සතුටු වන බව ද, කෙළෙහි ගුණ දන්නා බව ද, සුදුසු කල්හි බණ ඇසීම ද යන මේ (එක එකෙක්) උතුම් මංගල කාරණයන්ය.

## 9. ඛන්තී ච සෝවචස්සතා - සමණානඤ්ච දස්සනං; කාලේන ධම්මසාකච්ඡා - ඒතං මංගලමුත්තමං.

ඉවසීම ද, සුවච බව ද, ශ්‍රමණ උතුමන් දැක්ම ද, සුදුසු කල්හි ධර්ම සාකච්ඡාව ද යන මේ (එක එකෙක්) උතුම් උතුම් මංගල කාරණයන්ය.

## 10. තපෝ ච බ්‍රහ්මචරියඤ්ච - අරියසච්චාන දස්සනං; නිබ්බානසච්ඡිකිරියා ච - ඒතං මංගලමුත්තමං.

තපස ද, බඹසර ද (මෙවුන්දමින් වැළැක්ම, මහණදම, සසුන් බඹසර යන තුන් බඹසර ද), චතුරාර්යසත්‍ය දැකීමද (මාර්ගදර්ශනය ද), නිවන් පසක් කිරීම ද යන මේ (එක එකෙක්) උතුම් උතුම් මංගල කාරණයන්ය.

## 11. ඵුට්ඨස්ස ලෝකධම්මේහි - චිත්තං යස්ස න කම්පති; අසෝකං විරජං ඛේමං - ඒතං මංගලමුත්තමං.

අට ලෝ දහමින් පහස්නා ලද (ස්පර්ශ කරන ලද, මඬනා ලද) යමක්හුගේ සිත නො සැලේ ද, ශෝක රහිත ද, රාගාදි රජස් රහිත ද, කාමයෝගාදීන්ගෙන් නිරුපද්‍රිත ද, එ බඳු වූ රහතුන්ගේ සිතෙහි වූ ඒ නොසැලෙන බව ආදි එක එකෙක් උතුම් මංගල කාරණයන්ය.

## 12. ඒතාදිසානි කත්වාන - සබ්බත්ථමපරාජිතා; සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං තේසං මංගලමුත්තමන්ති.

යම් කෙනෙක් මෙබඳු මංගල කාරණයන් කිරීමෙන් හැම තන්හි (දෙලෙව්හි ම) නොපැරැදුනෝ ව සියලු ඉරියව්වෙහි ස්වස්ථ ව වෙසෙත් ද, එය (ඒ බාලයන් ඇසුරු නොකිරීම් ආදිය) ඔවුන්ට උතුම් මංගල කාරණයන්ය.

# රතනසුත්තං

1. **යානීධ භූතානි සමාගතානි**
   **භුම්මානි වා යානි ව අන්තලික්ඛේ;**
   **සබ්බේව භූතා සුමනා භවන්තු**
   **අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං.**

පොළොවෙහි වූ හෝ අහසෙහි වූ හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස් වූහු ද, ඒ සියලු අමනුෂ්‍යයෝ ම සතුටු සිතැත්තෝ වෙත්වා. තව ද මගේ වචනය සකසා අසත්වා.

2. **තස්මා හි භූතා නිසාමෙථ සබ්බේ**
   **මෙත්තං කරෝථ මානුසියා පජාය;**
   **දිවා ච රත්තො ච හරන්ති යේ බලිං**
   **තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා.**

භූතයෙනි, ඒ බැවින් සියලු තෙපි (මගේ වචනය) අසවු. මනුෂ්‍ය ප්‍රජාවට මෛත්‍රිය කරවු. යම් කෙනෙක් දහවල් ද රෑ ද පුද පඬුරු එළවත් ද, එහෙයින් නො පමා ව ම ඔවුන් රකිවු.

3. **යං කිඤ්චි වින්තං ඉධ වා හුරං වා**
   **සග්ගේසු වා යං රතනං පණීතං**
   **න නෝ සමං අත්ථි තථාගතේන**
   **ඉදම්පි බුද්ධේ රතනං පණීතං**
   **ඒතේන සච්චේන සුවත්ථි හෝතු.**

මේ මිනිස්ලොව හෝ නාලෝ ආදි අන් ලොවෙක හෝ යම් ධනයෙක් වේ ද දෙව්ලෝහි හෝ මහඟු රුවනෙක් වේ ද (ඔවුන් අතුරෙහි) තථාගතයන් හා සදෘශයෙක් නැත් ම ය. මෙ කරුණින් ද බුදුරජුහු උතුම් රුවනෙකි (නොහොත් මෙය බුදුරජුන් ගේ රත්නභාවය යි.) මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

4. **ඛයං විරාගං අමතං පණීතං**
   **යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ**
   **න තේන ධම්මේන සමත්ථි කිඤ්චි**
   **ඉදම්පි ධම්මේ රතනං පණීතං**
   **ඒතේන සච්චේන සුවත්ථි හෝතු.**

ශාක්‍යමුනින්ද්‍රයන් (ආර්යමාර්ග සමාධියෙන්) එකඟ වූ සිත් ඇත්තේ, කෙලෙස් නැසීමට නිමිති වූ, රාගයෙන් වෙන් වීමට නිමිති වූ, මරණයක් නැති, උතුම් වූ (මහත් වූ) යම් නිවනක් පසක් කළේ ද, ඒ දහම හා සම වූ කිසිවක් නැත්තේ ය. මෙ කරුණින් ද නිවන්දහම උතුම් රුවනෙකි. මේ සත්‍යවචනානුභාවයෙන් සෙත් වේවා.

**5. යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයී සුචිං**
**සමාධිමානන්තරිකඤ්ඤමාහු**
**සමාධිනා තේන සමො න විජ්ජති**
**ඉදම්පි ධම්මේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු.**

බුද්ධශ්‍රේෂ්ඨයන් තෙම අත්‍යන්තපරිශුද්ධ වූ යම් මාර්ගසමාධියක් වර්ණනා කළේ ද, බුද්ධාදීහු ආනන්තරික (අනතුරුව ම පල දෙන) සමාධිය යැ යී යමකට කියත් ද, ඒ සමාධිය හා සදෘශ (අන් සමාධි) යෙක් නැත. මේ කරුණින් ද ආර්යමාර්ගධර්මය උතුම් රුවනෙකි. මේ සත්‍යබලයෙන් සෙත් වේවා.

**6. යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා**
**චත්තාරි ඒතානි යුගානි හොන්ති**
**තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා**
**ඒතේසු දින්නානි මහප්ඵලානි**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු.**

සත්පුරුෂයන් විසින් පසස්නා ලද යම් ආර්ය පුද්ගලයෝ අට දෙනෙක් වෙත් ද නොහොත් ප්‍රශස්ත වූ යම් අටෝරාසියක් අරී පුගුලෝ වෙත් ද, මොහු හැම දෙන සතර යුග කෙනෙක් වෙති. සුගත බුදුරජුන්ගේ සවු වූ ඔහු තුමූ දක්ෂිණාවට සුදුස්සෝ වෙති. මේ බුදුසව්වන් කෙරෙහි දෙන ලද දානයෝ මහත් පල ඇත්තෝ වෙත්. මේ කරුණින් ද බුද්ධශ්‍රාවක සංඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍යබලයෙන් සෙත් වේවා.

**7. යෙ සුප්පයුත්තා මනසා දළ්හේන**
**නික්කාමිනෝ ගෝතමසාසනම්හි**
**තේ පත්තිපත්තා අමතං විගය්හ**
**ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු.**

ගොයුම් බුදුරජුන් ගේ සස්නෙහි වූ, සුවිශුද්ධ කායවාක්කර්ම සංඛ්‍යාත ශීලස්කන්ධයෙන් යුක්ත වූ, ස්ථිර සිතින් යුක්ත වූ, ප්‍රඥාව කරණ කොට ගෙණ සියලු කෙලෙසුන්ගෙන් නික්මුනා වූ යම් පුද්ගල කෙනෙක් වෙත් ද, ඔහු තුමූ නිවනට බැස ගෙණ නොමිලේ ම රහත්පල සමවත ලැබ ගෙණ එය විඳින්නාහු වෙති. මේ කරුණින් ද ආර්යසඞ්ඝයා උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

**8. යථින්දඛීලෝ පඨවිංසිතෝ සියා**
**චතුබ්භි වාතේහි අසම්පකම්පියෝ**
**තථූපමං සප්පුරිසං වදාමි**
**යෝ අරියසච්චානි අවෙච්ච පස්සති**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු.**

යම්සේ පොළොව තුළ වැද ගෙණ සිටි ඉන්ද්‍රකීලය තෙමෙ සිවු දිගින් හමන සුළඟින් සෙලවිය හැකි නොවේ ද. ආර්යසත්‍යයන් ප්‍රඥායෙන් බැස ගෙණ දක්නා සත්පුරුෂයා (හෙවත් සෝවාන් පුගුලා) එබන්දකු කොට කියමි. මේ කරුණින් ද ආර්යසඞ්ඝයා උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

**9. යේ අරියසච්චානි විභාවයන්ති**
**ගම්භීරපඤ්ඤේන සුදේසිතානි**
**කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා**
**න තේ භවං අට්ඨමමාදියන්ති**
**ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු.**

යම් සෝවාන් පුඟුල් කෙනෙක් ගැඹුරු නුවණැති බුදුරජුන් දෙසූ ආර්යසත්‍යයයන් තමනට ප්‍රකට කෙරෙත් ද, ඔහු බෙහෙවින් පමා වූවාහු නමුදු අටවන භවයක් නො ගණිති. මෙ කරුණින් ද ආර්යසංඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍යබලයෙන් සෙත් වේවා.

**10. සහාවස්ස දස්සනසම්පදාය**
**තයස්සු ධම්මා ජහිතා භවන්ති**
**සක්කායදිට්ඨී විචිකිච්ඡිතඤ්ච**
**සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි**
**චතූහපායෙහි ච විප්පමුත්තෝ**
**ඡචාභිඨානානි අභබ්බෝ කාතුං**
**ඉදම්පි සංඝෙ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු.**

මේ සෝවාන්හුගේ දර්ශනසම්පත්තිය (පළමු වන නිවන් දැක්ම) හෙවත් සෝවාන් මඟ නුවණ පහළ වීම සමග ම සත්කායදෘෂ්ටිය ද, (බුද්ධාදි අට තන්හි) සැකය ද, යම් මිථ්‍යා ශීලව්‍රත කෙනෙක් වූහු නම් ඒ සියල්ල ද යන මේ තුන් සංයෝජනයෝ දුරු කරණ ලද්දෝ වෙත්. හෙතෙම සතර අපායයන් කෙරෙන් මිදුනේ ද වේ. (ආනන්තර්ය කර්ම පසත් මිථ්‍යා දෘෂ්ටියත් යන බැරෑරුම් වූ පව් සය කරන්නට ද හේ අභව්‍ය ය (ඔහු විසින් ඒ පව් සය නො කට හැක්ක). මෙ කරුණින් ද ආර්යසංඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍යබලයෙන් සෙත් වේවා.

**11. කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං**
**කායෙන වාචා උද චේතසා වා**
**අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය**
**අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු.**

ඒ (සෝවාන්) පුද්ගල තෙම (ප්‍රමාදයෙකින්) කයින් හෝ වචනයෙන් හෝ නැත හොත් සිතින් හෝ කිසි වරදක් කරන්නේ නුමුදු, හේ එය සඟොවන්නට නො හැක්කේ ය. දක්නා ලද නිර්වාණපදය ඇති සෝවාන්හුගේ (වරද සැඟෙවීමෙහි) අභව්‍ය බව (හෙවත් වරද සැඟෙවිය නො හැකි බව) (බුදු රජුන් විසින්) වදාරන ලද්දේ ය. මේ කරුණින් ද ආර්‍යසංඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍යබලයෙන් සෙත් වේවා.

**12. වනප්පගුම්බේ යථා ඵුස්සිතග්ගේ**
**ගිම්හානමාසේ පඨමස්මිං ගිම්හේ**
**තථූපමං ධම්මවරං අදේසයි**
**නිබ්බානගාමිං පරමං හිතාය**
**ඉදම්පි බුද්ධෙ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු.**

වන ලැහැබ තෙමේ ග්‍රීෂ්ම ඍතුව සම්බන්ධී වූ ප්‍රථම ග්‍රීෂ්ම මාසයෙහි (හෙවත් බක් මස) සුපිපි අක් ඇත්තේ යම්සේ ද, එසේ වූ නිවන්පුර පමුණුවන පර්‍යාප්තිධර්මරත්නය පරමහිත වූ නිවන් පිණිස (ඒ බුදුරජ තෙම) දෙසී ය. මේ කරුණින් ද බුදුරජ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍යබලයෙන් සෙත් වේවා.

**13. වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ**
**අනුත්තරෝ ධම්මවරං අදේසයි**
**ඉදම්පි බුද්ධෙ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු.**

උතුම් වූ නිවන් දන්නා වූ, උතුම් නිවන දෙන්නා වූ, උතුම් නිවන් මඟ ගෙන හැර පාන්නා වූ, නිරුත්තර වූ බුදුරජ තෙම උතුම් දහමක් දෙසී ය. මේ කරුණින් ද බුදුරජ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍යබලයෙන් සෙත් වේවා.

**14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං**
**විරත්තචිත්තා ආයතිකේ භවස්මිං**
**තේ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා**
**නිබ්බන්ති ධීරා යථායං පදීපෝ**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු.**

යම් කෙනෙකුන්ගේ පුරාතන කර්ම (මෙයින් මත්තෙහි ප්‍රතිසන්ධියක් දිය නො හැක්කේ) රහත්මඟින් ක්ෂීණ වූයේ ද, (කර්මක්ෂය කළ බැවින් මත්තෙහි විපාක දිය හැකි) අළුත් කර්මයන්ගේ පහළ වීමෙකුත් නැද්ද, මතු භවයක් කෙරෙහි නො ඇලුණු සිතැති, ක්ෂීණ වූ ප්රතිසන්ධිවිඥාන සඞ්ඛාත වීජ ඇති, පුනර්භව සඞ්ඛාත සංස්කාර වෘද්ධිය කෙරෙහි කැමැත්තක් නැති, ධෛර්යසම්පන්න වූ ඒ රහත්හු මේ පහන මෙන් අවසන් සිත නිරුද්ධ වීමෙන් පිරිනිවෙත්. මේ ද සඞ්ඝයා ගේ උතුම් රුවන් බවෙකි). මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

**15. යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යානි ව අන්තලික්ඛේ**
**තථාගතං දේවමනුස්සපූජිතං**
**බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු.**

පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙ තන්හි රැස් වූහු ද, ඔහු ද, මම් ද (අපි) දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත බුදුරජාණන් වහන්සේ නමදිමු. (සත්ත්වප්‍රජාවට) සෙත් වේවා.

**16. යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යානි ව අන්තලික්ඛේ**
**තථාගතං දේවමනුස්සපූජිතං**
**ධම්මං නමස්සාම සුවත්ථි හෝතු.**

පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙ තන්හි රැස් වූහු ද, ඔහු ද, මම් ද දෙව්මිනිසුන් විසින් පුදන ලද, (බුද්ධාදීන්) විසින් අවබෝධ කරන ලද බැවින් තථාගත වු ධර්මය නමදිමු. (සත් වගට) සෙත් වේවා.

**17. යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යානි ව අන්තලික්ඛේ;**
**තථාගතං දේවමනුස්සපූජිතං**
**සඞ්ඝං නමස්සාම සුවත්ථි හෝතු.**

පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙ තන්හි රැස් වූහු ද, ඔහු ද, මම් ද දෙව්මිනිසුන් විසින් පුදන ලද (ආත්මහිතයෙහි පිළිපන්නවුන් විසින් යෑ යුතු මඟෙහි යෑම් ආදී අරුතින්) තථාගත වූ සංඝයා නමදිමු. සෙත් වේවා.

# මෙත්තසුත්තං - කරණීය මෙත්ත සූත්‍රය

**1. කරණීයමත්ථකුසලේන - යන්තංසන්තං පදං අභිසමෙච්ච,**
**සක්කෝ උජූ ච සුජූ ච - සුවචෝ චස්ස මුදු අනතිමානී.**

යම් ඒ ශාන්තිපද සංඛ්‍යාත නිර්වාණයෙක් වේ ද, එයට පැමිණ නොහොත් එය අවබෝධ කොට වසනු කැමති අභිවෘද්ධිය සලසා ගැණීමෙහි දක්ෂයා විසින් එයට සුදුසු දෙය කළ යුතුය. නිවණට පැමිණ වසනු කැමැත්තේ සත්‍ය ප්‍රතිවෙධය පිණිස පිළිපදින්නට දක්ෂයෙක් වන්නේ ය. (දක්ෂයකු විය යුතු ය.) ඍජු වන්නේ ය. එක් වරක් ඍජු වීමෙන් නො නැවතී දිවි ඇති තාක් මනා කොට ඍජු වන්නේ ය. අන්‍යයන් ගේ අවවාද මනාකොට පිළිගැණීම් වශයෙන් සුවච වන්නේ ය. මෘදු වන්නේ ය. අතිමාන ඇත්තේ නො වන්නේ ය.

**2. සන්තුස්සකෝ ච සුභරෝ ච**
**අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති,**
**සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච**
**අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ.**

ලද දෙයින් සතුටු වන්නෙක් ද, පහසුවෙන් පෝෂණය කළ හැක්කෙක් ද, ස්වල්ප කටයුතු ඇත්තෙක් ද, සැහැල්ලු පැවතුම් ඇත්තෙක් ද, සන්හුන් ඉඳුරන් ඇත්තෙක් ද, ප්‍රඥා ඇත්තෙක් ද, හැඩි දැඩි අසංවර ගති නැත්තෙක් ද, කුලයන් කෙරෙහි නො ඇලුනෙක් ද වන්නේ ය.

**3. න ච ඛුද්දං සමාචරෙ කිඤ්චි**
**යේන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං,**
**සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු**
**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා.**

නුවණැති අන්‍යයන් නින්දා කරණ සුළු වරදක් වත් නො කරන්නේ ය. "සියලු සත්ත්වයෝ සැප ඇත්තෝ වෙත්වා, භය නැත්තෝ වෙත් වා, සුඛිත සිත් ඇත්තෝ වෙත් වා"යි ද,

**4. යේ කේචි පාණභූතත්ථි - තසා වා ථාවරා වා අනවසේසා**
**දීඝා වා යේ මහන්තා වා-මජ්ඣිමා රස්සකාණුකථූලා.**

තෘෂ්ණාභය සහිත හෙයින් තැති ගන්නා සුලු වූ ද, තෘෂ්ණා භය ප්‍රහීණ කළ හෙයින් ස්ථාවර වූ ද යම් කිසි සත්ත්වයෝ ඇත්තාහු නම්, ඒ සියලුදෙනා ද, (නාගාදී) දික් ශරීර ඇත්තෝ ද, (හස්ති ආදී) මහත් ශරීර ඇත්තෝ ද, (අශ්වගවමහිෂාදී) මධ්‍යම ප්‍රමාණ ශරීර ඇත්තෝ ද, (වාමනාදී) මිටි සිරුරු ඇත්තෝ ද, (පියෙවි ඇසට නොපෙණෙන) ඉතා සියුම් ශරීර ඇත්තෝ ද, (මස් කැසුබු ආදී) ස්ථූල ශරීර ඇත්තෝ ද,

5. **දිට්ඨා වා යේව අදිට්ඨා - යේච දූරෙ වසන්ති අවිදූරෙ,**
**භූතා වා සම්භවේසී වා-සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා.**

ඇස් හමුවට පැමිණීම් වශයෙන් දුටු සත්තු ද, ඈත සිටි හෙයින් නුදුටු සත්තු ද, යම් සත්ත්ව කෙනෙක් දුරත් ලඟත් වසත් නම් ඔහු ද, ඉපදීම අවසන් කළ සත්ත්වයෝ ද (ක්ෂීණාශ්‍රවයෝ ද), මතු ඉපදීම සොයන (ශෛක්ෂ පෘථග්ජන) සත්ත්වයෝ ද යන මේ සියලු සත්ත්වයෝ සුඛිත සිත් ඇත්තෝ වෙත්වා යි ද මෙත් වඩන්නේ ය.

**6. න පරෝ පරං නිකුබ්බේථ - නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි,**
**බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා - නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය.**

එකෙක් අනෙකකු නො රවටන්නේ ය. අනෙකකුට අවමන් නො කරන්නේ ය. (නො කෙරේ වා) බ්‍යාරෝසනා නම් වූ කය හා වචනය පිළිබඳ විකෘතියෙන් ද ප්‍රතිඝසංඥා සඞ්ඛ්‍යාත මනෝවිකාරයෙන් ද එකෙක් අනෙකකුට දුකක් නො කැමති වන්නේ ය. (නො කැමති වේවා).

**7. මාතා යථා නියං පුත්තං - ආයුසා ඒකපුත්තමනුරක්ඛෙ**
**ඒවම්පි සබ්බභූතේසු - මානසං භාවයේ අපරිමාණං.**

මව යම්සේ තමාගෙන් ඇති වූ එක ම ඖරස පුත්‍රයා ජීවිතපරිත්‍යාගයෙන් වුවත් රක්නේ ද, එ පරිද්දෙන් ම සියලු සත්ත්වයන් කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රීසහගත සිත වඩන්නේ ය.

8. **මෙත්තඤ්ච සබ්බලෝකස්මිං - මානසං භාවයේ අපරිමාණං**
**උද්ධං අධෝ ච තිරියඤ්ච - අසම්බාධං අවේරං අසපත්තං.**

උඩ ද යට ද සරස ද (සතුරන් ය යි කියන ලද) සීමාවකුදු නැති ව අතරතුර වත් වෛර චේතනා පහළ වීමක් නැතිව, සතුරන් රහිත ව සියලු ලෝකසත්ත්වයා කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රීසහගත සිත වඩන්නේ ය.

**9. තිට්ඨං චරං නිසින්නෝ වා - සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ**
**ඒතං සතිං අධිට්ඨෙය්‍ය - බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු.**

සිටින්නේ හෝ ඇවිදින්නේ හෝ උන්නේ හෝ නිදන්නේ හෝ යම් තාක් මෛත්‍රීසහගත සිහිය ඉටනු කැමැත්තේ ද, ඒ තාක් පහ වූ මිද්ධය (අලස බව) ඇති ව ඉටන්නේ ය. මේ මෛත්‍රීවිහරණය මේ බුද්ධශාසනයෙහි ශ්‍රේෂ්ඨ විහරණයැ යි ප්‍රකාශ කළහ.

**10. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා - දස්සනේන සම්පන්නෝ**
**කාමේසු විනෙය්‍ය ගේධං - න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතීති.**

(සත්ත්වයෙක් පුද්ගලයෙක් ඇත්තේ ය යන) මිථ්‍යාදෘෂ්ටියට නො පැමිණ (ලොකෝත්තරශීලයෙන්) සිල්වත් වූයේ (සෝතාපත්තිමග්ගසම්මාදිට්ඨි ය යි කියන ලද) දර්ශනයෙන් යුක්ත වූයේ (සකෘදාගාමි අනාගාමී මාර්ග දෙකින්) වස්තුකාමයන්හි ගිජුබව දුරු කොට, ඒකාන්තයෙන් ම නැවත ගර්භයෙක් හි විසීමට නො පැමිණෙන්නේ ය. (ශුද්ධාවාසයයෙක ඉපිද එහි දි ම රහත්බවට පැමිණ පිරිනිවන් පාන්නේ ය.)

**ඒතේන සච්ච වජ්ජේන සොත්ති තේ හෝතු සබ්බදා**

මේ සත්‍ය වචනයේ ආනුභාව බලයෙන් ඔබටද යහපතක්ම වේවා!

## මෙත්තා භාවනා - මෛත්‍රී භාවනාව..

**අහං අවේරෝ හෝමි** - මම වෛර නැත්තෙක් වෙම්වා..
**අබ්‍යාපජ්ඣෝ හෝමි** - තරහ නැත්තෙක් වෙම්වා..
**අනීඝෝ හෝමි** - දුක් පීඩා නැත්තෙක් වෙම්වා..
**සුඛී අත්තානං පරිහරාමි** - සුවසේ ජීවත් වෙම්වා..
**අහං විය මය්හං** - මා මෙන් ම මාගේ,
**ආචරිඋපජ්ඣායා** - ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලා ද,
**මාතා පිතරෝ** - මව් පියවරු ද,
**හිත සත්තා** - හිතවත් සත්වයෝ ද,
**මජ්ඣත්තික සත්තා** - මැදහත් සත්වයෝ ද,
**වේරීසත්තා** - වෛරී සත්වයෝ ද,
**අවේරා හොන්තු** - වෛර නැත්තෝ වෙත්වා,
**අබ්‍යාපජ්ඣා හොන්තු** - තරහ නැත්තෝ වෙත්වා..
**අනීඝා හොන්තු** - දුක්පීඩා නැත්තෝ වෙත්වා..
**සුඛී අත්තානං පරිහරන්තු** - සුවසේ ජීවත් වෙත්වා..
**දුක්ඛා මුච්චන්තු** - දුකින් මිදෙත්වා..
**යථා ලද්ධසම්පත්තිතෝ මා විගච්ඡන්තු කම්මස්සකා** - කර්මානුකූලව ලද සම්පත් වලින් නො පිරිහෙත්වා..
**ඉමස්මිං විහාරේ** - මේ විහාරයේ සිටින,
**ඉමස්මිං ගෝචර ගාමේ** - මේ ගොදුරු ගමෙහි සිටින,
**ඉමස්මිං නගරේ** - මේ නගරයේ සිටින,
**ඉමස්මිං දීපේ** - මේ දීපයේ සිටින,
**ඉමස්මිං චක්කවාළේ** - මේ සක්වලෙහි සිටින,
**ඉස්සර ජනා** - අධිපති ජනයෝ,
**සීමට්ඨක දේවතා** - සීමා වාසී දෙවිවරු,
**සබ්බේ සත්තා** - සියලු සත්වයෝ,
**අවේරා හොන්තු** - වෛර නැත්තෝ වෙත්වා,
**අබ්‍යාපජ්ඣා හොන්තු** - තරහ නැත්තෝ වෙත්වා..
**අනීඝා හොන්තු** - දුක්පීඩා නැත්තෝ වෙත්වා..
**සුඛී අත්තානං පරිහරන්තු** - සුවසේ ජීවත් වෙත්වා..
**දුක්ඛා මුච්චන්තු** - දුකින් මිදෙත්වා..

**යථා ලද්ධසම්පත්තිතෝ මා විගච්ඡන්තු කම්මස්සකා** - කර්මානුකූලව ලද සම්පත් වලින් නො පිරිහෙත්වා..
**පුරත්ථිමාය දිසාය** - නැගෙනහිර දිශාවේ සිටින,
**දක්ඛිණාය දිසාය** - දකුණු දිශාවේ සිටින,
**පච්ඡිමාය දිසාය** - බටහිර දිශාවේ සිටින,
**උත්තරාය දිසාය** - උතුරු දිශාවේ සිටින,
**පුරත්ථිමාය අනුදිසාය** - නැගෙනහිර අනුදිශාවේ සිටින,
**දක්ඛිණාය අනුදිසාය** - දකුණු අනුදිශාවේ සිටින,
**පච්ඡිමාය අනුදිසාය** - බටහිර අනුදිශාවේ සිටින,
**උත්තරාය අනුදිසාය** - උතුරු අනුදිශාවේ සිටින,
**හෙට්ඨිමාය දිසාය** - යට දිසාවේ සිටින,
**උපරිමාය දිසාය** - උඩ දිසාවේ සිටින,
**සබ්බේ සත්තා** - සියලු සත්වයෝ,
**සබ්බේ පාණා** - සියලු ප්‍රාණීන්,
**සබ්බේ භූතා** - සියලු භූතයෝ,
**සබ්බේ පුග්ගලා** - සියලු පුද්ගලයෝ,
**සබ්බේ අත්තභාවපරියාපන්නා** - ජීවිතයක් ලබා ගත් සත්වයෝ,
**සබ්බා ඉත්ථියෝ** - සියලු ස්ත්‍රීන්,
**සබ්බේ පුරිසා** - සියලු පුරුෂයෝ,
**සබ්බේ අරියා** - සියලු ආර්යයෝ,
**සබ්බේ අනරියා** - සියලු අනාර්යයෝ,
**සබ්බේ දේවා** - සියලු දෙවියෝ,
**සබ්බේ මනුස්සා** - සියලු මනුෂ්‍යයෝ,
**සබ්බේ අමනුස්සා** - සියලු අමනුෂ්‍යයෝ,
**සබ්බේ විනිපාතිකා** - සියලු අපායවාසී සත්වයෝ,
**අවේරා හොන්තු** - වෛර නැත්තෝ වෙත්වා,
**අබ්‍යාපජ්ඣා හොන්තු** - තරහ නැත්තෝ වෙත්වා..
**අනීඝා හොන්තු** - දුක්පීඩා නැත්තෝ වෙත්වා..
**සුඛී අත්තානං පරිහරන්තු** - සුවසේ ජීවත් වෙත්වා..
**දුක්ඛා මුච්චන්තු** - දුකින් මිදෙත්වා..
**යථා ලද්ධසම්පත්තිතෝ මා විගච්ඡන්තු කම්මස්සකා** - කර්මානුකූලව ලද සම්පත් වලින් නො පිරිහෙත්වා..

**කායේන වාචා චිත්තේන පමාදේන මයාකතං**
**අච්චයං ඛම මේ භන්තේ භූරිපඤ්ඤ තථාගත**
පමා වූ මා විසින් සිතින් කයින් වචනයෙන් කරන ලද යම් වරදක් වේ නම් තථාගතයන් වහන්ස එයට මට සමාව දෙන සේක්වා.

**කායේන වාචා චිත්තේන පමාදේන මයාකතං**
**අච්චයං ඛම මේ ධම්ම සන්දිට්ඨික අකාලික**
පමා වූ මා විසින් සිතින් කයින් වචනයෙන් කරන ලද යම් වරදක් වේ නම් සාන්දෘෂ්ඨික වූ අකාලික වූ ශ්‍රී සද්ධර්මය මට සමාව දෙන සේක්වා.

**කායේන වාචා චිත්තේන පමාදේන මයාකතං**
**අච්චයං ඛම මේ සංඝ සුපටිපන්න අනුත්තර**
පමා වූ මා විසින් සිතින් කයින් වචනයෙන් කරන ලද යම් වරදක් වේ නම් අනුත්තර වූ ආර්ය මාර්ගයට පැමිණියා වූ උතුම් සංඝරත්නය මට සමාව දෙන සේක්වා.

**ඉච්චේවමච්චන්ත නමස්සනීයං**
**නමස්සමානෝ රතනත්තයං යං**
**පුඤ්ඤාභිසන්ධං විපුලං අලත්ථං**
**තස්සානුභාවේන හතන්තරායෝ**
මෙසේ අතිශයින් නමස්කාර කටයුතු වූ රත්නත්‍රය නමස්කාර කරමින් යම් වූ මහත් වූ පින් රැසක් ලැබීමි, ඒ ආනුභාවයෙන් නසන ලද උවදුරු ඇත්තෙක් වෙමි.

**ආකාසට්ඨාච භුම්මට්ඨා දේවා නාගා මහිද්ධිකා**
**පුඤ්ඤං තං අනුමෝදිත්වා චිරං රක්ඛන්තු සාසනං**
**ආකාසට්ඨාච භුම්මට්ඨා දේවා නාගා මහිද්ධිකා**
**පුඤ්ඤං තං අනුමෝදිත්වා චිරං රක්ඛන්තු දේසනං**
**ආකාසට්ඨා ච භුම්මට්ඨා දේවා නාගා මහිද්ධිකා**
**පුඤ්ඤං තං අනුමෝදිත්වා චිරං රක්ඛන්තු මංපරං**
ආකාශයෙහි සහ පොලොවෙහි වසන මහත් සෘධි ඇති දිව්‍ය නාග සමූහයා මේ පින් අනුමෝදන්ව ශාසනය ද, සද්ධර්මය ද, මාද සියලූ සත්වයෝ ද, බොහෝකල් රකිත්වා.

**එත්තාවතාච අම්හේහි සම්භතං පුඤ්ඤසම්පදං**
**සබ්බේ දේවා අනුමෝදන්තු සබ්බ සම්පත්ති සිද්ධියා**
**එත්තාවතාච අම්හේහි සම්භතං පුඤ්ඤසම්පදං**
**සබ්බේ භූතා අනුමෝදන්තු සබ්බ සම්පත්ති සිද්ධියා**
**එත්තාවතාච අම්හේහි සම්භතං පුඤ්ඤසම්පදං**
**සබ්බේ සත්තා අනුමෝදන්තු සබ්බ සම්පත්ති සිද්ධියා**
මෙපමණ කාලයක් අප විසින් රැස් කරන ලද පුඤ්ඤ සම්පත්තිය සියලූ සම්පත් පිණිස සියලූ දෙවියෝද, සියලූ භූතයෝද සියලූ සත්වයෝද අනුමෝදන් වෙත්වා.

**ඉදං මේ ඤාතීනං හෝතු සුඛිතා හොන්තු ඤාතයෝ ///**
මේ පින් මාගේ ඤාතීන්ට වේවා. නෑයෝ සුවපත් වෙත්වා.

**ඉමිනා පුඤ්ඤකම්මේන මා මේ බාලසමාගමෝ**
**සතං සමාගමෝ හෝතු යාව නිබ්බාන පත්තියා ///**
මේ පින් මහිමයෙන් නිවන් දක්නා ජාතී දක්වා මට බාල ඇසුරක් නොවේවා. සත්පුරුෂ ඇසුරක් වේවා.

**ඉදං මේ පුඤ්ඤං ආසවක්ඛයාවහං හෝතු සබ්බදුක්ඛා**
**පමුඤ්චතු**
මේ පින මට කෙලෙස් සංසි`දවීම පිණිසත්, සියලු දුකෙන් අත්මිදීම පිණිසත් හේතු වේවා.

හැම සිතකම පින් සිතුවිලි වේවා!
මෙත් කරුණා දියරෙන් නැහැ වේවා!
සාමය සමඟිය ඉන් ඇති වේවා!
සියළුදෙනා ලොව සුවපත් වේවා!

කිසිවකු හට හිංසා නො කෙරේවා!
කිසිවකු හට අවමන් නො කෙරේවා!
කිසිවකු හට නින්දා නො කෙරේවා!
සියළුදෙනා ලොව සුවපත් වේවා!

දුකින් පෙළෙන සත් දුකින් මිදෙත්වා!
බියෙන් පෙළෙන සත් බියෙන් මිදෙත්වා!
සොවින් පෙළෙන සත් සොම්නස් වෙත්වා!
නිතින් මෙ හැම සත් සුවපත් වෙත්වා!

**දස මාසේ උරේ කත්වා - පොසේසි වුද්දිකාරණං**
**ආයූ දීඝං වස්සසතං - මාතු පාදං නමාමහං**

**වුද්ධිකාරෝ ආලිංගිත්වා - චුම්බිත්වා පියපුත්තකං**
**රාජ මජ්ජං සුපතිට්ටං - පීතුපාදං නමාමහං**

සන්සාරේ මරු කතරට වහින වැස්ස අම්මා...
දිවි ගමනේ ගිම් නිවන්න නුග සෙවනකි අම්මා...
කලුවර රෑ අහස් කුසේ දිලෙන සඳයි අම්මා...
සංසාරේ ගිමන් නිවා බුදු වීයන් සම්මා...

දිවි ගමනට පෑයූ මගෙ හිරු මඬලයි පියා...
මෙරක් තරම් දුක උහුලන මහ පොලවයි පියා...
මගෙ පපුවේ ජීවය රැදි හුස්ම පොදයි පියා...
ජීවන මග කෙලවර කොට නිවන් දකින් පියා...

## ස්වාමින් වහන්සේට වන්දනා කිරීම

**ඕකාස වන්දාමි භන්තේ**

*ස්වාමීන් - සුඛී හෝතු*

**කතං සබ්බං අච්චයං ඛමත මේ භන්තේ**

*ස්වාමීන් - ඛමාමි*

**මයා කතං පුඤ්ඤං සාමිනා අනුමෝදිතබ්බං**
*ස්වාමීන් - සාධු ! සාධු ! සාධු ! අනුමෝදාමි*

**සාමිනා කතං පුඤ්ඤං මයිහං , දාතබ්බං**
*ස්වාමීන් - සාධු ! අනුමෝදිත*

**සාධු ! සාධු ! සාධු ! අනුමෝදාමි**
**ඕකාස ද්වාරත්තයේන කතං සබ්බං**
**අච්චයං ඛමත මේ භන්තේ**
*ස්වාමීන් - ඛමාමි , ඛමි තබ්බං*

**ඕකාස ඛමාමි භන්තේ**
**දුතියම්පි ඕකාස ඛමාමි භන්තේ**
**තතියම්පි ඕකාස ඛමාමි භන්තේ**

සීලවන්තං ගුණවන්තං
පුඤ්ඤ ඛෙත්තං අනුත්තරං
දුර්ලබෙන මයා ලද්දං
වන්දි තුං පත්ති තුං වරං

සාරිපුත්ථාදී තේරාණං
ආගතං පටිපාටියං
සද්ධා සීල දයා වාසං
බුද්ධ පුත්තං නමාමහහං

**සාධු ! සාධු ! සාධු !**

# සබ්බේ සත්තා සුඛිනෝ භවන්තු

සියලු සත්වයෝ සුවපත් වෙත්වා..!!!